## අඩු ආදායම්ලාභීන්ගේ ණය අවශ්‍යතාවයන් ඉටු කරන .....

# සමෘද්ධි බැංකු

**ග්‍රාමීය ණය සම්බන්ධයෙන් දිගු අතීතයක් පවතී. එමෙන්ම, ණය යනු ආපසු දිය යුතු මුදල් ගනුදෙනුව කි. ඊට විවිධ කොන්දේසි තිබේ. විවිධ සුරකුම් ද පවතී.**

**ණය යනු ආපසු දිය යුතු මුදල් ගනුදෙනුව කි. ඊට විවිධ කොන්දේසි තිබේ. විවිධ සුරකුම් ද පවතී.**

ණය නොගෙවන අය මතු ආත්මයක දී ණය හිමිකරුට විවිධාකාරයෙන් සේවා ලබා දී එය ගෙවා දමන බවට අප සමාජයේ පවතින කතා එමට ය. බර කරත්තයක බැඳ ඇති ගොනෙකු ගැන අප කියන්නේ ණය ගෙවන බවකි.

රෑ දහවල් ශ්‍රමයට සරිලන වැටුපක් නොලබා ශ්‍රමය වැය කරන සේවකයෙකු දකින්නේ පෙර ආත්මයක ණය කරුවකු ලෙසිනි.

අම්මා දුන් කිරිවල ණය ගෙවන්නට ආත්ම ගණනාවක දී වුවත් බැරි බවට කියැ වේ.

මේ අනුව, **අතීතයේ සිට දේශීය සංස්කෘතිය තුළ ණය යන්න පැවතියේ නීතිය මත නොව සාදචාරාත්මකව අනිවාර්යයෙන්ම ආපසු ගෙවිය යුත්තක් ලෙස ය.**

ග්‍රාමීය ණය ක්‍රියාවලිය තුළ අපට ගමේ ප්‍රකට චරිතයක් වන **පොලී මුදලාලි** ගේ චරිතය සිහියට නැගේ ඔහුගේ කොන්දේසි නිසා ණය ලබන්නා කබලෙන් ලිපට වැටෙන තත්ත්වයට පත් වේ.

ණයක් ලබාගෙන නිසි සැලසුමක් මත එය ආයෝජනය කර දියුණුව ළඟා කර ගත හැකිය. ණය ලබාදීම සඳහා ග්‍රාමීය මට්ටමේ පිහිටුවා ඇති ආයතන සංඛ්‍යාව අති විශාල ය.

මෙරට ජනගහනයෙන් බහුතරය අඩු ආදායම්ලාභීන් හෙවත් දුප්පතුන් වන අතර පවත්නා ආයතන වලින් ණය ලබා ගැනීමට ඔවුනට ඇති හැකියාව ගැන අවධානය යොමු කළ යුතු ය. ඇපකරුවන් හා විවිධ සුරකුම් ද, ණයක් ලබා ගැනීමේ දී සකස් කර ගත යුතු විශාල සංඛ්‍යාවක් වූ ලේඛන ද ණය ඉල්ලුම් කරන්නාට ණය එපා කරවන සුළු ය.

එමෙන්ම, වාණිජ බැංකු ක්ෂේත්‍රය තුළ ණය ආපසු ගෙවීමේ ආර්ථික ශක්තියක් ඇති අය හට ඇති සැලකිල්ල හා ප්‍රමුඛතාවය දුප්පතුන් සම්බන්ධයෙන් සමානව නොපවතී.

**අතීතයේ සිට දේශීය සංස්කෘතිය තුළ ණය යන්න පැවතියේ නීතිය මත නොව සාදචාරාත්මකව අනිවාර්යයෙන්ම ආපසු ගෙවිය යුත්තක් ලෙස ය.**

මේ නිසා, 1995 වසරේ දී හඳුන්වා දුන් **සමෘද්ධි වැඩ සටහන** යටතේ අඩු ආදායම්ලාභීන්ට සහනාධාර මුදලක් දීමත් සමඟම ඔවුන් ඉතිරි කිරීම් වලට පෙළඹවීමටත්, ණය අවශ්‍යතා ඉටුකර දීමටත් සමෘද්ධි බැංකු සංගම් ආරම්භ කරනු ලැබීය.

ඒ අනුව, 2001.08.31 දිනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 255 ක් තුළ විවෘත කර ඇති සමෘද්ධි බැංකු සංගම් සංඛ්‍යාව 970 කි. මෙදිනට සමෘද්ධිලාභී කොටස් කරුවන් 1,683,386 ක් වූ අතර ඔවුන් ආරම්භ කරන ලද මුළු ගිණුම් සංඛ්‍යාව 2,922,094 කි.

**සමෘද්ධි බැංකු** ඔස්සේ සමෘද්ධිලාභීනට ඒ වනවිට ලබා දී ඇති ණය සංඛ්‍යාව 1,247,054 ක් වූ අතර එහි මූල්‍යමය අගය රුපියල් දස ලක්ෂ 4,488 කි. ණය ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය 105% කි.

**සමෘද්ධි වැඩ සටහන** ඔස්සේ **සමෘද්ධි බැංකු** සංගම් මඟින් ණය ලබාදීමේ දී භාවිතා කර ඇත්තේ සමෘද්ධිලාභීන්ගේ මුදල් ය. මෙපමණ විශාල මුදලක් නැත්පත් කිරීම සඳහා

ඔවුන් කුඩා කණ්ඩායම් වශයෙන් හා සමෘද්ධි සමිති වශයෙන් සංවිධානය කොට සමෘද්ධි බැංකුවට සම්බන්ධ කර තිබේ.

**ණය ලබාදීමේ දී මුලින්ම කුඩා කණ්ඩායම් වෙත ඉදිරිපත් කරනු ලබන ණය අයදුම් පත සමෘද්ධි බැංකු සංගමයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කිරීමෙන් පසු ණය ලබාදීම සිදු කෙරේ.**

**ණය ලබාදීමේ දී මුලින්ම කුඩා කණ්ඩායම් වෙත ඉදිරිපත් කරනු ලබන ණය අයදුම් පත සමෘද්ධි බැංකු සංගමයේ පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කිරීමෙන් පසු ණය ලබාදීම සිදු කෙරේ.** ඒ අනුව, කුඩා කණ්ඩායමේ අයෙකු විසින් ලබා ගන්නා ණය පිළිබඳව කණ්ඩායමේ සෙසු සාමාජිකයන්ට ද වගකීමක් පවතී. මේ නිසා, ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ණය ලබාගත් සාමාජිකයා උනන්දු කරවීම සෙසු සාමාජිකයන්ගේ වගකීමක් වී තිබේ. කුඩා කණ්ඩායම සතියකට වරක් එක්වන නිසා ණය ආපසු ගෙවීමේ අඩුපාඩු වෙතොත් ඒ ගැන මැදිහත් වී කරුණු පහදා දී ගැටළු ඇති නොවීමට වග බලා ගැනේ.

**සමෘද්ධි බැංකු වලින් ලබාගන්නා ණය ආපසු ගෙවීමේ ප්‍රතිශතය 105% ක මට්ටමක පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත්තේ මෙම සංවිධාන ව්‍යුහයේ ක්‍රියාවලිය තුල ය.**

මේ අනුව, ස්වයං රැකියා කටයුතු සඳහාත්, කෘෂිකාර්මික කටයුතු සඳහාත් යෙදවීමට ණය මුදලක් ලබා ගැනීමට නොහැකිව විවිධ දුෂ්කරතා වලට මුහුණ දුන් අඩු ආදායම් ලාභීන්ට සමෘද්ධි බැංකු ඔස්සේ ලැබී ඇත්තේ නොමඳ අස්වැසිල්ලකි.

සමෘද්ධි බැංකු ඔස්සේ ලබා දෙනු ලබන ණය මුදල්, මුල දී රු.5000/- - රු.10,000/- වශයෙන් වුව ද, මේ වන විට, සමහර සමෘද්ධි බැංකු සංගම්වල රු.25,000/ දක්වා වැඩි වී තිබේ.

මේ නිසා, විවිධ ස්වයං රැකියා ආරම්භ වීමේ ප්‍රවණතාවයක්

**සමෘද්ධි බැංකු වලින් ලබාගන්නා ණය ආපසු ගෙවීමේ ප්‍රතිශතය 105% ක මට්ටමක පවත්වා ගැනීමට හැකියාව ලැබී ඇත්තේ මෙම සංවිධාන ව්‍යුහයේ ක්‍රියාවලිය තුල ය.**

ඇති වී තිබෙන අතර සුළු කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ද වර්ධනයක් පවතී.

සමෘද්ධි බැංකු සංගම් ඔස්සේ දෙනු ලබන ණය මුදල් වලට අමතරව කුඩා කණ්ඩායම් විසින් ඉතා සුළු වශයෙන් තම කණ්ඩායම් රැස්වීම් වල දී එකතු කරනු ලබන මුදල් ද කණ්ඩායම් සාමාජිකයන්ගේ විවිධ අවශ්‍යතා වලට යොද ගැනීම සඳහා භාවිතා කෙරේ. මේ නිසා ග්‍රාමීය අඩු ආදායම් ලාභී ජනතාවගේ මුදල් අවශ්‍යතා වල දී ගමේ පොලී මුදලාලිගෙන් කරගත් අත මාරු මෙම කණ්ඩායම් ක්‍රියාවලිය තුලින් ඉටුවීම, අඩු ආදායම්ලාභීන්ට වාසිදයක තත්ත්වයක් ඇති කර තිබේ.

2001.08.31 දින වන විට, දිවයිනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 225 ක තිබූ කුඩා කණ්ඩායම් 247,816 ක, මේ ආකාරයට භාවිතා කිරිම සඳහා එකී කුඩා කණ්ඩායම්වල අත රැ දී තිබූ මුදල් ප්‍රමාණය මිලියන 189 කි.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය මූල්‍ය ආයතනවල ණය කොටස විශ්ලේෂණයකට භාජනය කිරීමේ දී සමෘද්ධි බැංකු සංගම් විසින් ලබා දී ඇති ණය ප්‍රමාණය 2000 වසර අවසානයට 12.8% කි. මෙහිලා සමුපකාර ග්‍රාමීය බැංකුව 25.4 ක ප්‍රතිශතයක් ලබමින් මුල් තැන ගෙන ඇතත් සමෘද්ධි බැංකු සංගම් මඟින් ණය ලබා දී ඇත්තේ අඩු ආදායම් ලාභීනට පමණක් බැවින් සමෘද්ධි බැංකු මඟින් ලබා දී ඇති ණය ප්‍රමාණය ඉහළ අගයක පවතී.

**රුවිනි විදානපතිරණ**

***පර්යේෂණ නිලධාරිණී,***

**අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය,**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

***සිතුවිල්ලක්........***

ස්වභාව ධර්මය, කාලය හා ඉවසීම යනු මහා වෛද්‍යවරු තිදෙනෙකි.

**-එච්.ජී. බෝන්-**